# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2095/8 - 2018 ඔක්තෝබර් මස 30 වැනි අඟහරුවාදා - 2018.10.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ඉඩම් අමාත්‍යංශ ගොනු අංකය*: LD/5/2009/A/42.
*මගේ අංකය*: 3/1/ඉ/අ.ප/1.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය* :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපොල ඕතොට කෝරලේ සුළු කොට්ඨාසයේ පනලිය ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන සකස් කරන ලද කු.2405 හා 2018 අගෝස්තු මස 15 වැනි දිනැති මූලික පිඹුරේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ල.

කැබලි අංක 1
ඉඩමේ නම: සෙරපීස්වත්ත; හිමිකම් කියන්නන්: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්ටයාර් 2.0381.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018.11.30 දින පෙරවරු 10.00 ට පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2018.11.16 වැනි දිනට මත්තෙන් එම ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩී. අනෝමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
පොල්ගහවෙල.

2018 ඔක්තෝබර් මස 26 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11 - 596




ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.